# විශේෂ නිවේදනයයි.

**ඊශ්‍රායලයේ සේවය කරන දැනට නිවාඩු මත ශ්‍රී ලංකාවේ සිටින සියලුම සාත්තු සේවක සේවිකාවන් වෙත,**

ඊශ්‍රායලයේ කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් මීට පෙර පල කරන ලද නිවේදනයන්ට වැඩිමනත් වශයෙනි.

නැවත ඇතුල්වීමේ වීසා බලපත්‍රයක් (Re-entry) සහිතව 2020.03.18 දිනට පෙර ඊශ්‍රායලයෙන් පිටත්ව ගිය සියලුම සාත්තු සේවකයින්හට ඊශ්‍රායලයේ ඔවුන්ගේ සේවා යෝජකයන් වෙත නැවත පැමිණීමේදී විශේෂ සීමාවන්ට යටත්ව පහත සඳහන් මාර්ගෝපදේශ ඊශ්‍රායලයේ අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇත.

ඒ අනුව, පහත දැක්වෙන මාර්ගෝපදේශ පිළිපැදීම සඳහා ඔබේ අවධානය යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

1. සාත්තු සේවකයින් ඊශ්‍රායලයට ගොඩබසින දින සිට දින 14 ක් නිරෝධායනයේ රැඳී සිටිය යුතුය (එම ස්ථානය සේවා යෝජකයාගේ නිවස නොවිය යුතු අතර මුළු කාලයම එකම ස්ථානයේ රැඳී සිටියි යුතුය.)

2. අදාල සාත්තු සේවකයින්ගේ මූලික අවශ්‍යතා වන ආහාර ආදිය ඇතුළුව ඔහුගේ/ඇයගේ නිරෝධායනය මෙන්ම ඔවුන්ගේ වෛද්‍ය රක්ෂණය සඳහාද සේවායෝජකයා වගකිව යුතුය.

3. අදාල සාත්තු සේවකයා/සේවිකාව ඊශ්‍රායලයට ඇතුලු වීමෙන් පසු ගුවන් තොටුපලේ සිට නිරෝධායන ස්ථානයට කෙලින්ම පැමිණි බවට සේවායෝජකයා සහතික විය යුතුය.

4. සාත්තු සේවකයා/සේවිකාව ඊශ්‍රායලයට පැමිණීමට පෙර ඔහු / ඇය දින 14 ක් නිරෝධායනයේ (වැටුප් රහිතව) රැඳී සිටීමට කැමති බවට ප්‍රකාශයක් අත්සන් කළ යුතුය. එම ප්‍රකාශය ලබා ගැනීම සේවා යෝජකයා සතු වගකීමක් වේ.

5. සාත්තු සේවකයන් ඊශ්‍රායලයට ඇතුළු වූ විට සේවායෝජකයා විසින් ඔහු/ඇය නිරෝධායන ස්ථානයට පැමිණීම පිළිබඳව වහාම සෞඛ්‍ය අමාත්‍යාංශයට වාර්තා කළ යුතුය.

6. නිරෝධායන කාලය අතරතුර ඔවුන් වෙතින් රෝග ලක්ෂණ මතු වුවහොත් හෝ රෝගාතුර වුවහොත්, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඊට අදාල වන පරිදි කටයුතු සිදු කරනු ඇත. එසේ අසනීප වුවහොත් ඔහු/ ඇය දින 14 කට වඩා තවදුරටත් නිරෝධායනයේ රැඳී සිටීමට සිදු විය හැක.

7. සියළුම අවශ්‍යතා සපුරාලන්නේ නම් ඊශ්‍රායලයට නැවත ප්‍රවේශ වීමේ වීසා බලපත්‍රය (Re-entry Visa) සඳහා අයදුම් කිරීම ඊශ්‍රායලයේ රැකියා නියෝජිත ආයතනය (Foreign Employment Agency in Israel) විසින් කළ යුතුය.

8. අයදුම්පත අනුමත වූ පසු අදාල සාත්තු සේවකයන්හට ඔවුන්ට ආසන්නතම ඊශ්‍රායල කොන්සල් කාර්යාලයෙන් / තානාපති කාර්යාලයෙන් නැවත ප්‍රවේශ වීමේ වීසා බලපත්‍රය (Re-entry Visa) ලබාගැනීමට හැකි වේ.

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
ටෙල් අවිව්, ඊශ්‍රායලය.

24.05.2020